# ගොවි දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති ඩී. බී. විජේතුංග මැතිතුමා සමග කළ සාකච්ඡාව


**ප්‍රශ්නය :-**

ගරු ජනාධිපති තුමනි, ඔබ ජනාධිපති ධුරයේ වැඩ බාරගත් විගසම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුව බලාපොරොත්තුවෙන් වැඩදායී වෙනස්කම් කීපයක් කරන ලද්දෙහි ය. **වී සහතික මිල** ප්‍රමාණය ඉහළ දැමීම ඉන් කැපී පෙනෙන එක් සිද්ධියකි. එම තීරණය වඩාත් ඵලදායී කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කළ යුතු වෙනවා නේද? මේ අනුව වී අලෙවි මණ්ඩලයට සහනදායී කොන්දේසි මත ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් සැපයීම අවශ්‍ය වනු ඇත මෙවර යල් කන්නය අවසානයේ වී සහතික මිල පවත්වා ගැනීම සඳහා ගෙන ඇති පියවරයන් සඳහන් කළ හැකි ද?

**පිළිතුර :-**

අප දැනටමත් වී අලෙවි මණ්ඩලය වේගයෙන් වෙනස් කර ගෙන යනවා. අරපිරිමැසුම් දයක නොවන හා අතහැර දැමූ වී ගබඩා ප්‍රයෝජනවත් ආකාරයෙන් යොදවා ගැනීමට කටයුතු කර තිබෙනවා. ඒ සමගම ගම්බදව එකතු කිරීමේ ගබඩා ඇති කිරීමට පෞද්ගලික අංශය උනන්දු කර තිබෙනවා. රු. දශලක්ෂ 350 කට වැඩි ප්‍රමාණයක් වී අලෙවි මණ්ඩලයට ණය වශයෙන් ලබා දී තිබෙනවා. මෙම මුදල් යල ආරම්භයට පෙර සැපයිය යුතු බවට භාණ්ඩාගාරයට හා බැංකු වලට උපදෙස් දී තිබෙනවා. ඒත් සමගම අස්වැන්න කපා ගැනීමත් සමගම වී එකතු කර ගැනීම සඳහා ඒ පිළිබඳව දැඩි අවධානයෙන් සිටින ලෙසට වී අලෙවි මණ්ඩලයට උපදෙස් දී තිබෙනවා.

රජය බලාපොරොත්තු වන්නේ කුඩා ගොවියාට අසාධාරණයක් හෝ අවාසියක් නොවන ආකාරයට වී සහතික මිල විවෘත වෙළඳ පොලේ ක්‍රියාත්මක වෙනවා දැකීමටයි. වී අලෙවි මණ්ඩලය කරනු ලබන්නේ විවෘත වෙළඳ පොලේ වී සඳහා ඇති වෙළඳ මිල සහතික මිලට වඩා පහල වැටෙන්නට ඉඩ නොදී ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වීමයි. පෞද්ගලික වෙළෙන්ඳ සහතික මිලට. ගොවියාගෙන් වී මිළ දී ගත යුතු යි. යම් හෙයකින් ගොවියාට වී සඳහා ගෙවන මිළ අඩු වුවහොත් එතන දී වී අලෙවි මණ්ඩලය ඉදිරිපත් වෙනවා. ඒ අනුව වී අලෙවි මණ්ඩලය ක්‍රියා කරන්නේ මුර බල්ලෙකු ලෙසට යි. එනම්, ගොවියාට අවාසියක් වන අවස්ථාවේදී ඉදිරිපත් වී ගොවියාට වෙළඳ පොලේ මිළ ස්ථාවර තත්ත්වයට ගෙන ඒමට උදව් කිරීමයි.



**ප්‍රශ්නය :-**

ජනාධිපතිතුමනි, අපගේ අත්දැකීම අනුව, **වී අලෙවි මණ්ඩලය** ක්‍රියාත්මක වන විට වෙළඳපොලේ වී මිල සහතික මිලට වඩා වැඩියෙන් පැවතීමටත්, වී අලෙවි මණ්ඩල ක්‍රියාත්මක නොවන විට වී මිල පහත බැසීමටත් හේතු වෙනවා. මේ නිසා වී අලෙවි මණ්ඩලය ඵලදායී මිල දී ගන්නෙකු ලෙසට ඉදිරිපත් විය යුතු යි. ඒ කාර්යය ඉටු කිරීම සඳහා වී අලෙවි මණ්ඩලයට අවශ්‍ය මුදල්, අස්වැන්න නෙලා ගැනීමට සතියකටවත් කලින් ලබා දිය යුතු වෙනවා. අපේ ඇස්තමේන්තු අනුව මේ සඳහා රු. දශලක්ෂ 450 ක් වත් අවශ්‍ය වෙනවා.

**පිළිතුර :-**

අපි ඒ බව දන්නවා. ඒ අනුව යල කන්නයේ වි මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට රුපියල් දශ ලක්ෂ 350 ක් ලබාදී තිබෙනවා. මීට අමතරව වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ආදයම් ප්‍රතිපාදනයන් සහ භාණ්ඩාගාර අයවීම් ඇමති මණ්ඩලය විසින් අනුමත කොට තිබෙනවා.

(අ.) සහනාධර මිල යටතේ මිලදී ගත් බඩ ඉරිඟු වලින් සිදු වූ පාඩුව පියවා ගැනීමට 1994 මූල්‍ය ඇස්තමේන්තු වලින් රු. දශලක්ෂ 61 ක් සපයා දී ඇත.

භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුමට අයවිය යුතු මුදල පියවීමට රු. දශලක්ෂ 140 ක අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම

(ආ). පොහොර මිල දි ගැනීමට රුපියල් දශලක්ෂ 40 ක් රාජ්‍ය බැංකුවකින් ලබා ගැනීමට අවශ්‍ය සුරැකුම් සැපයීම. වී අලෙවි මණ්ඩල විසින් රාජ්‍ය බැංකු වලින් ලබා ගන්නා ණය සීමාව වැඩි කිරීමට තීරණය කර ඇති අතර, මෙය වී අලෙවි මණ්ඩලය පාඩු නොවන ආකාරයෙන් පවත්වාගෙන යන බවට ඇති දැඩි විශ්වාසයෙන් කරනු ලබන්නකි.

**ප්‍රශ්නය :-**

ජනාධිපතිතුමනි, වොෂින්ටනයේ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමග ඒකාබද්ධව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණුකිරීමේ ආයතනය කළ

අධ්‍යයනයන් වල දී පෙනී ගියේ අපේ සම්පත් යොදා ගෙන කරනු ලබන වී නිෂ්පාදනය ආර්ථික අතින් කාර්යක්ෂම බවයි. ඔබතුමා දන්නා පරිදි අපි වගා කරන වී වර්ග වලින් 90%ට වැඩි ප්‍රමාණයක් ඉහළ ඵලදාවක් ලබා දෙන, එහෙත් රසායනික පොහොර මත යැපෙන හා රසායනික පොහොර වලට ඉතා තදබල ලෙස සංවේදීතාවක් දක්වන ඒවා. 1992 දී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව පසුගිය වසරේ පොහොර නිකුතුව 1989 වසරට වඩා 19% කින් පහල ගොස් ඇත. මේ අනුව පොහොර සහනාධාරය යලි ඇති කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

**පිළිතුර :-**

සහනාධාර පිළිබඳ ප්‍රශ්නය මතු වන්නේ වී නිෂ්පාදන වියදම් ඉහල යාමට අනුරූපව වී මිල නොගැලපුවහොත් පමණි. ඔබ සඳහන් කළ පොහොර භාවිතය අඩු වීම අයහපත් දේශගුණික හේතු නිසා පොහොර යෙදවීම අඩු නිසා ද සිදු වෙනවා. රජය සුලු ගොවීන් සඳහා කෘෂිකාර්මික භාරකාර අරමුදල මගින් අවශ්‍ය පොහොර හා බිත්තර වී වැනි ද්‍රව්‍ය ආධාර ලබාදීමට කටයුතු කරනවා. පොහොර සහනාධාරය නැවතත් ස්ථාපිත කිරීමට රජය බලාපොරොත්තු වන්නේ නැත. වාණිජමය මට්ටමකින් කුඹුරු ගොවිතැන් කරන්නන් රසායනික පොහොර ගෙන භාවිතා කිරීම නතර කිරීමට අපි පෙළඹිය යුතු නැත. **නමුත් සුළු පරිමාන ගොවියා සැම අතින්ම ආරක්ෂා කර ගැනීම අපගේ වගකීමක්ව පවතිනවා.** සුළු ගොවියා සතුව ඇත්තේ බොහෝ විට අක්කරයකට, අක්කර භාගයකට හෝ ඊට වඩා අඩු කුඹුරු ප්‍රමාණයක්. රසායනික පොහොර භාවිතය තව තවත් ලිහිල් කිරීමෙන් අපි අපේ සුළු ගොවියා අමාරුවේ දමනවා. මේ පොළොවේ අපේ සත්ත්ව සංහතියටම වැදගත් වන කොටස තමා මේ මතුපිට ඇති අඟල් 6 ක පස් තට්ටුව.රසායනික පොහොර මගින් මෙම පස් තට්ටුවේ ඇති ස්වාභාවික සාරවත්භාවය නැති කරනවා. **අපේ පාරම්පරික ක්‍රම, පසෙහි ඇති සාරවත් බව නොනැසී පවත්වා ගැනීමට උපකාර වෙනවා. රසායනික පොහොර දිගින් දිගටම යොදවනවිට යම් දවසක මෙම පස කිසිම රසායන පොහොරකට සංවේදී නොවන තත්ත්වයකට ඇද දමනවා.** ඔහුට අවශ්‍ය ආහාර ඔහු විසින්ම සපයා ගන්නා තත්ත්වය අපි ඔහුට අහිමි කර දීමට දරණ ක්‍රියා මාර්ගයකට මම එකඟ නැත. මේ ගම්බද සුළු ගොවියා කිසිවෙකුට බරක් නොවී අද ආහාර වලින් ස්වයංපෝෂිත මට්ටමක ඉන්නවා. ඔවුන් හා අප ජීවත් වන මා ඉහත කී පස් තට්ටුව ආරක්ෂා කර දීමට අපි පියවර ගත යුතු යි. **හැකිතාක් ඓන්ද්‍රීය පොහොර භාවිතයට ඔවුන් නැවත වරක් හුරු කළ යුතු යි. මේ මගින් පසේ හ්‍යුමස් තත්ත්වය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සැම පහසුකමක්ම අපි සුළු ගොවියාට ලබා දියයුතු යි.** ඒ සඳහා සැම පියවරක් ම ගත යුතු යි. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දිය යුතු යි. "සුදුරු සම්බා" වැනි සාම්ප්‍රදායික වී වර්ග වගා කිරීමට ඔවුන් උනන්දු කළ යුතු ය. ඒ අතරතුර කෘෂිකර්මික භාරකාර අරමුදල මගින් අතිකුත් ගොවි මහතුන්ට අවශ්‍ය බිත්තර වී හා පොහොර ලබා දිය යුතු ය.

**ප්‍රශ්නය :-**

ජනාධිපතිතුමනි, **කෘෂිකාර්මික භාරකාර අරමුදලෙහි** ඇති මුදල් ප්‍රමාණය රු. දශලක්ෂ 150 කි. එය ලබා දෙන්නේ 16% ක් වැනි ඉහළ පොලී අනුපාතයකට ය. මෙම අරමුදල රු. දශලක්ෂ 1000 ක් දක්වා වැඩි කිරීමටත්, පොලී අනුපාතිකය අඩු කිරීමටත් ඔබතුමාට පියවර ගත හැකි ද?

**පිළිතුර :**

මේක වැදගත් ප්‍රශ්නයක්. අපි කෘෂිකාර්මික භාරකාර අරමුදලින් ලබා දෙනු ලබන මුදල වැඩි කරන්නම්, පොලී අනුපාතිකය අඩු කරන්නම්. මේ මගින් ගොවීන් විශාල ප්‍රමාණයකට සහාය විය හැකියි. **ගොවීන් සඳහා බැංකු පිහිටුවීමටත්, සකසුරුවම් සමිති ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇසුරින් ආරම්භ කිරීමටත් ගොවීන් උනන්දු කළ යුතු අතර, වගා රක්ෂණය තව තවත් ව්‍යාප්ත කළ යුතු යි.**

**ප්‍රශ්නය :-**

පසුගිය වසර දෙක තුළ වී නිෂ්පාදනයේ අගය එකතු වීමේ ප්‍රමාණය 8% කින් පමණ අඩු විය. මෙය රු. දශලක්ෂ 6000 ක් වූ අතර තේවල දායකත්වය මෙන් දෙකහමාර ගුණයකි. අපේ ජාතික ආරක්ෂාව ලෙස පිළිගැනෙන්නේ ද ජාතික මට්ටමේ නිවාස වල පවත්වා ගන්නාවූ ආහාර තොගයන්ය. මෙම තත්ත්වය යටතේ මෙම "අපනයන දශකය" තුළ ආහාරයෙන් ස්වයංපෝෂිත භාවය ලඟා කර ගැනීම සඳහා ප්‍රමුඛත්වය දීම වැදගත් වෙනවා. අපගේ පාලනයෙන් තොර විදේශීය වෙළඳ පොළක් කරා කෘෂිකාර්මික භාණ්ඩ සැපයීමට අවශ්‍ය වතුර හා ඉඩම් වැනි සම්පත් යෙදවීම අනතුරුදායක නොවේ ද?

**පිළිතුර**

ස්වයංපෝෂිත භාවය සඳහා කථා කරන විට කිව යුත්තේ අප දැනටමත් වී වලින් දල වශයෙන් 85% ක අවශ්‍යතාව සපුරා ගෙන ඇති බවයි. මෙය ක්‍රම ක්‍රමයෙන් ඉහල නැංවීම අපගේ අරමුණයි. මේ තත්ත්වය ළඟා කර ගැනීම සඳහා ගරු අගමැතිතුමා යටතේ පිහිටුවනු ලබන ඒකකයක් මගින් වගාවට අවශ්‍ය යෙදවුම් පිළිබඳ සමීප අධීක්ෂණයක් හා මෙහෙයවීමක් කරනු ලබනවා. ගොවීන් සඳහා ලබා දිය යුතු පෙළඹවීම් පිළිබඳව ද මෙම ඒකකය සොයා බලනු ඇත.

**ප්‍රශ්නය :-**

අප කරනු ලැබූ අධ්‍යයනයන් හි දී අපට දක්නට ලැබී ඇත්තේ අපේ වාණිජ බැංකු ක්‍රමය සුළු ගොවියාට ණය සපයා දී මෙහි ලා මැලි කමක් දක්වන බව ය. **පවත්නා වාණිජ බැංකු ක්‍රමය** මගින් කෘෂි අංශයට සපයා දී ඇත්තේ අවශ්‍යතාවයෙන් 5% කටත් වඩා අඩු ණය ප්‍රමාණයකි. ඒ වාගේම අපේ ගොවීන්ගේ නිෂ්පාදන ණය අවශ්‍යතාවයන් ගණන් බැලීමේ දී ඔවුන්ගේ පාරිභෝජන අවශ්‍යතාවය ගැන නොසලකා ඇති බව පෙනී යනවා. මෙම ප්‍රශ්නය විසඳීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග කවරේ ද?

**පිළිතුර :-**

සුළු ගොවීන්ට උදව් දියහැක්කේ බැංකු ක්‍රමය මගින් පමණක් නොවේ. කෘෂිකාර්මික භාරකාර අරමුදල මගින් සුළු ගොවියාට ලබා දිය යුතු උදව් උපකාර පිළිබඳව මා මීට පෙර සඳහන් කළා. සුළු ගොවීන්ගේ පැත්තෙන් බලන කල මෙය ඉතාම වැදගත් ප්‍රශ්නයක්.**අද පවත්නා වාණිජ බැංකු ක්‍රමය සුළු ගොවීන් අමතක කර දමා ඇති බව මා නොදන්නවා නොවේ.** සුළු ගොවීන් ආරක්ෂා කිරීමේ පියවරක් වශයෙන් සුළු ගොවියාගේ නිෂ්පාදන කටයුතු වලට අවශ්‍ය මූල්‍ය පහසුකම් වාණිජ බැංකු වලින් ලබා දීමට ශ්‍රී ලංකාවේ මූල්‍ය පනත වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපි මැලිවන්නේ නැහැ. විශේෂයෙන් ම වාණිජ බැංකුවල ඉතුරුම් සුළු ගොවියාගේ තැන්පතු මගින් ලැබෙන බව අමතක නොකළ යුතු ය.

ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා වාණිජ බැංකු තම තැන්පත් මුදල් වලින් අනිවාර්ය ප්‍රතිශතයක් ගොවි කෘෂි කටයුතු සඳහා ණය වශයෙන් වැඩිපුර ආහාර නිෂ්පාදනයට ලබා දී, පවත්නා ග්‍රාමීය බැංකු ක්‍රමයත්, සමුපකාර ක්‍රමයත්, කෘෂිකාර්මික භාරකාර අරමුදලත් සහයෝගීව කටයුතු කරමින් සුළු ගොවියා නගා සිටුවීමට උත්සාහ කරනු ඇතැයි ද මා විශ්වාස කරනවා.

**මෙ තත්ත්වය යටතේ සමුපකාර ක්‍රමය** ඉතා වැදගත් වෙනවා රුසියාවේ තියෙනවා සාමාජිකයින් තුන් දෙනෙක් පමණක් ඉන්න සමුපකාර. තාත්තා හා ළමුන් දෙදෙනා තමා සාමාජිකයෝ. මෙම සමුපකාර සඳහා ඔවුන් විසින් පිළිවෙල කර ගත් නීතිරීති තියෙනවා.

එවැනි සමිති ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ද ඔවුන් ගන්නවා. අවංකභාවය තමා මෙහි දී ඉතාමත් ම වැදගත්. සමුපකාරවල ඒක පුද්ගල උපරිම ණය සීමාවන් මත සාමාජිකයන්ට ණය ලබා ගැනීමට ඉඩ පහසුකම් සලසා දීම අදට ඉතා ගැලපෙනවා.

**ප්‍රශ්නය :**

සුළු ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා තවදුරටත් සුළු ගොවියාගෙන් ඉටු විය යුතු රාජකාරි කොටස ලෙස ඔබතුමා හඳුන්වන්නේ කුමක් ද?

**පිළිතුර :-**

සුළු ගොවියා අන් අය සමග එකතු වී වැඩ කිරීමට පුහුණු විය යුතු යි. මෙය සාහමුහිකත්වය වර්ධනය කිරීමට හේතු වෙනවා. ඒත් සමගම සුළු ගොවියා අවංක විය යුතු යි. අවංක භාවය සුළු ගොවියා තුළ පමණක් නොව, මුළු රටවැසියා තුළම ඇති කළ යුතුයි. දෙවනුව ජල කළමනාකරණය පිළිබඳව ගොවියා පමණක් නොව සියලු දෙනාවම දැනුවත් කළ යුතු යි. මෙය ජාතික අවශ්‍යතාවයකි. තෙවනුව සහල් පදනම් කර ගත් ක්ෂණික ආහාර වෙළඳපොලට හඳුන්වා දිය යුතු යි. මෙ මගින් තිරිඟු පිටි සඳහා වැය වන විශාල විදේශ විනිමයක් ඉතිරි කර ගත හැකිවීමට අමතරව දේශීය ගොවියා ස්වදේශීය ආහාර නිෂ්පාදනයට තව තවත් උනන්දු කළ හැකියි. සාම්ප්‍රදායික මී ගවයින් යොද ගන්නා බිම් සකස් කිරීමේ ක්‍රමයට නැවත ගම්බද සුළු ගොවියා උනන්දු කළ යුතු යි. මී ගවයින් ඝාතනය කිරීම සපුරා නතර කිරීමට දැනට පවතින නීතිරීති තදින්ම ක්‍රියාත්මක කළ යුතුයි.

**ප්‍රශ්නය :-**

සත්ත්ව හා කිරි නිෂ්පාදනය ශ්‍රී ලංකාව තුළ ආදයම් ඉපදවීමේ හා මන්ද පෝෂණය නැති කිරීමේ හැකියාව ඇති ඉතා හොඳ ව්‍යාපෘතියකි. කිරි කර්මාන්තය තිවාස මට්ටමින් දියුණු කිරීමට ඔබ ගන්නා පියවරයන් කවරේ ද?

**පිළිතුර :-**

කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් වැඩි දියුණු කිරීමට පියවර ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉන්දියානු කිරි නිෂ්පාදන මණ්ඩලයේ සහාය ද ලබා ගැනීමට පියවර ගෙන ඇත. විශේෂයෙන් ඉන්දියාවේ ක්‍රියාත්මක වන ආකාරයට කිරි ගොවි සමුපකාර ඇති කිරීමට ආචාර්ය කුරියන්ගේ සහාය ලබා ගැනීම ද දැනට කෙරෙනවා. මේ සඳහා ජනසවි භාරකාර අරමුදලින් හා කෘෂිකාර්මික භාරකාර අරමුදලින් සහාය බලාපොරොත්තු වෙනවා. මෙම වැඩසටහන ද අගමැති තුමා යටතේ පිහිටුවනු ලබන ඒකකයේ සමීප අධීක්ෂණයට ලක් වෙනවා

**ප්‍රශ්නය :-**

ගැමියන්ගේ ප්‍රෝටීන අවශ්‍යතා සම්පූර්ණ කරන වැදගත් දයකත්වයක් මිරිදිය මසුන් මගින් ලැබෙනවා. මෙම කර්මාන්තය පුනරුත්ථාපනය කිරීම අවශ්‍යයි. ඔබතුමා ඒ සඳහා ගන්නා පියවර මොනවා ද?

**පිළිතුර :**

රජය මේ ක්ෂේත්‍රය පිළිබඳ ඍජු සම්බන්ධයක් ඇති කර ගත යුතු නැහැ. කළයුත්තේ මිරිදිය ක්ෂේත්‍රය හඳුනා ගෙන ඒ සඳහා පෞද්ගලික අංශය යොමු කරවීමයි. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට මෙහි දී ප්‍රධාන භූමිකාවක් රඟ පෑ හැකියි. මේ සම්බන්ධව විශේෂඥයන් කැඳවා සුදුසු වැඩ සටහනක් සලකා බැලීම සඳහා පිළියෙල වීම අත්‍යාවශ්‍යයි. මෙහිදී දේශීය අවශ්‍යතා පමණක් නොව අපනයන කිරීමේ හැකියාව ද සොයා බැලීම වැදගත් බව මතක තියා ගන්න.

සාකච්ඡා කලේ -
**ඩී. ජේ. පී. සෙනෙවිරත්න**
අධ්‍යක්ෂ

**එල්. පී. රූපසේන**
(අංශ ප්‍රධාන/
අලවි හා ආහාර ප්‍රතිපත්ති අංශය)

☆ ☆ ☆

**දෙවො වස්සතු කාලෙන**
**සස්ස සම්පත්ති හෙතු ච**
**ඵීතො භවතු ලොකො ච**
**රාජා භවතු ධම්මිකො**